


# බෞද්ධ ධජයේ ඉතිහාසය

*බෞද්ධ ධජයට වසර 125 ක් පිරෙයි*



ශ්‍රී ලංකිවේ බොදු පුනරුදය සහ අනන්‍යතාව උදෙසා 1880 දි ජේ ආර් ද සිල්වා මහතා සහ කර්නල් හෙන්රි ස්ටිල් ඕල්කට් තුමා එක්ව ආදර්ශ බෞද්ධ කොඩිය නිර්මානය කරන ලද අතර එය නියම වශයෙන් සකසන ලද්දේ 1885 දි හික්කඩුවේ ශ්‍රී සුමංගල මහනාහිමියන්ගේ සභාපතිත්වයෙන් යුත් ශ්‍රී ලංකාවේ කොළඹ කමිටුව විසිනි. එම කමිටුවේ සෙසු සාමාජිකයන් වුයේ, පුජ්‍ය මිගෙට්ටුවත්තේ ගුනානන්ද නාහිමි, දොන් කරෝලිස් හේවාවිතාරන (අනගාරික ධර්මපාල තුමාගේ පියා) අන්දිරිස් පෙරේරා ධර්මගුනවර්ධන (අනගාරික ධර්මපාල තුමාගේ මව් පාර්ශවයේ සියා) විලියම් ද ආබෲ චාල්ස් ඒ ද සිල්වා, පිටර් ද ආබෲ, එච්.විලියම් පුනාන්දු, එන්.එස්.ප්‍රනාන්දු යන විද්වතුන් වු අතර එහි ලේකම් වරයා වුයේ කරෝලිස් පුජිත ගුනවර්ධනයන්ය.

මෙම කොඩියේ ආකෘතිය සරසවි සඳරැස පුවත්පතේ 1885 අප්‍රේල් 17 දින පළවු අතර 1885 මැයි 28 වෙනි දිනට යෙදුන වෙසක් පුන් පොහෝ දින එය පළමුවරට කොටහේන දිපදුත්තාරාම විහාරස්ථානයේදි ඔසවන ලද්දේ පුජ්‍ය මිගෙට්ටුවත්තේ ගුනානන්ද නාහිමියන් වහන්සේ විසිනි.. බ්‍රිතාන්‍ය පාලනය යටතේ වෙසක් පොහොය නිවාඩු දිනයක් ලෙසට ප්‍රකාශයට පත් කරන ලද පළමු වෙසක් පොහොය එදින විම තවත් ඓතිහාසික කරුණකි.

ඇමෙරිකානු ජාතික මාධ්‍යවේදි, එමෙන්ම පරමවිඥාර්ථ සභාවේ නිර්මාතෘ සහ පළමු සභාපතී වු කර්නල් හෙන්රි ස්ටිල් ඕල්කට් තුමා එම ධජය ජාතික කොඩියේ ප්‍රමාණයට සකස් විය යුතුය යන බවට කරන ලද යෝජනාව පිලිගෙන නව ධජය 1886 අප්‍රේල් 08 වෙනි දින නිකුත්වු සරසවි සඳරැස පුවත්පත මගින් ප්‍රසීද්ධ කරන ලද අතර 1886 වෙසක් දිනයේදි පලමු වරට ඔසවන ලදි.1889 දි අනගාරික ධර්මපාලතුමා සහ ඕල්කට් තුමා එම ධජය ජපානයේ අධිරාජයාට හඳුන්වා දි පරිත්‍යාග කළ අතර ඊට පසුව බුරුමයට ලබා දෙන ලදි.

1950 මැයි මස 25 වෙනි දින පවත්වන ලද ලෝක බෞද්ධ සම්මේලනයේ ප්‍රාරම්භක රැස්විමේදි එහි ආරම්භක සභාපති මහාචාර්ය ගුනපාල මලලසේකර මහතා මෙම ධජය ලෝක බෞද්ධ ධජය ලෙස පිළිගත යුතු බවට කළ යෝජනාව ඒකමතිකව සම්මත විය.

1952 දි බෞද්ධ ධජය ජාත්‍යන්තර වශයෙන් පිලිගන්නා ලදි.

**ගාමිණි ෆොන්සේකා**

සභාපති ඕස්ට්‍රේලියාවේ සදහම් පදනම සදගම් හඬ බෞද්ධ ගුවන් විදුලි වැඩසටහනේ සම්පාදක.


## Business Card

### Service Stations







### Handyman




### Refrigeration




### Towing




### Grocery Stores




### Medical




### Wholesalers




**The perfect place for your Business Card**

**$15 per month***
(*Conditions Apply)

**Contact**
Asoka 0425 720 932